කටාන ප්‍රාදේශීය සභාව - 2020
--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

කටාන ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

1.2.1(අ), 1.2.2(අ), (ආ), 1.2.4,1.2.5(ආ)(i), 1.2.5(ඇ), 3.1.1 හා 3.3.1(ආ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිති සඳහා වන FS 5 සටහන් අංක 3.4 ප්‍රකාරව හුවමාරු වන ගණුදෙනුවලින් වන අයභාරයන් ඒවා උපලබ්දිවූ විට හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වූවද, එකතුව රු.15,000,000 ක් වූ උසාවි දඩ හා මුද්දර ගාස්තු උපචිත පදනම මත ගිණුම් තබා රු.49,770,581 ක් උපචිත කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් ප්‍රතිපත්තිය මුද්දර ගාස්තු හා උසාවි දඩ සඳහා උපචිත පදනම ලෙස නිවැරදි විය යුතුවේ. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) ප්‍රමිති අංක 18.7 හා LGD/10A/4/න.ගි/2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාරව සභාවේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රාදේශීය සභාවේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) ප්‍රමිති 3.5 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ සිට ස්ථාවර වත්කම් වර්ග 14 ක් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, සභාව සතු මුළු වටිනාකම රු.647,755,973 ක් වූ ස්ථාවර වත්කම් ඉඩම්, ගොඩනැගිලි, පිරියත හා යන්ත්‍ර, ලීබඩු සහ සවිකිරීම්, මෝටර් වාහන, වෙනත් උපකරණ හා පුස්තකාල පොත් ලෙස පමණක් වර්ගීකරණය කර තිබුණි. | වත්කම් වර්ග අනුව වර්ගීකරණය කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිතිවල සඳහන් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ නිදර්ශනාත්මක ආකෘති අනුව පොලී ගෙවීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ දැක්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ පොලී ගෙවීම් රු.1,054,025 ක් පරිපාලන වියදම් යටතේ දක්වා තිබූ අතර රු.1,860,000 ක් වූ ණය වාරික ගෙවීම් වත්කම් යටතේ ගිණුම්ගත නොකොට මූල්‍ය පිරිවැය යටතේ ගිණුම්ගත කර තිබුණි. | ප්‍රමාද දෝෂයකින් පරිපාලන වියදම් යටතේ දක්වා ඇති අතර ණය වාරික ගෙවීම මූල්‍ය පිරිවැය යටතේ දක්වා ඇති බව දන්වමි. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | ප්‍රමිති අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු නමුත් ලැබූ රු. 116,301,876 ක ප්‍රතිපාදන මුදලම සටහන් අංක 05 යටතේ අයභාරය ලෙස ගිණුම් ගත කර සටහන් අංක 10 යටතේ අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ ඉතිරියක් ලෙස කිසිදු මුදලක් දක්වා නොතිබුණි. | 202 වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව ගිණුම් ඉදිරිපත් කරන බව දන්වමි. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | ප්‍රමිතිවල සඳහන් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ නිදර්ශනාත්මක ආකෘති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 05 හා 10 පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව ගිණුම් ඉදිරිපත් කරන බව දන්වමි. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (උ) | ප්‍රමිති අංක 6.11 ප්‍රකාරව ක්ෂය කළ යුතු සියළු ස්ථාවර වත්කම් ක්ෂය කර නොතිබුණි. | ඉදිරියේදී ඉඩම් හැර සියළු ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | ප්‍රමිති අංක 11:10 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් පිළිබඳව අනාවරණ කළ යුතු වුවද සභාවට එරෙහිව පැවරූ නඩු 5 ක් පිළිබඳව අනාවරණය කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති ගාස්තු අවසාන ගිණුමේ ණයහිමියන් වශයෙන් දක්වා ඇති බව දන්වමි. | ශ්‍රී ලංකා පළාත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අනාවරණය කිරීම් කළ යුතුවේ |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ බාහිර ආධාරවල ගිවිසුම්ගත මුළු වටිනාකම රු.120,722.018 ක් වූ අතර එයින් වර්ෂය තුළ නිමවූ කළ වැඩවල වටිනාකම රු.6,353,445 ක් ස්ථාවර වත්කම් ලෙස හා නිම නොකළ වැඩවල වටිනාකම රු.57,187,573 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේ සිට 2021 ගිණුම්වලට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුළත් EG 3.2 ප්‍රකාරව පාරවල් සහ බෝක්කු සහ වෙනත් යටිතල පහසුකම් අයිතමයන් දේපල පිරියත උපකරණ යටතේ වෙනස් ගිණුම්කරණ කේත යටතේ ගිණුම්ගත කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ රු. 51,081,887 ක් වැයකර සංවර්ධනය කළ පාරවල්, බෝක්කු හා කාණු එසේ ගිණුම් ගත කර නොතිබූ අතර. සභාවට අයත් සියළු මාර්ග , පාලම් හා බෝක්කුවල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේ සිට 2021 ගිණුම්වලට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ අවසානයට තිබූ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ වූ රු.647,755,973 ක ශේෂය, ශුද්ධ වත්කම් හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශයට ගැලපීම් නොකර වර්ෂ අවසානයේ වත්කම් හා වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | වර්ෂයේ සිට 2021 ගිණුම්වලට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයක කාල පරිච්ඡේදය තුළ මුදල් හා මුදල් හා සමානදෑවල ශුද්ධ වටිනාකමට වර්ෂය ආරම්භයේ වූ මුදල් හා මුදල් හා සමානදෑවල වටිනාකම එකතු කළ විට වර්ෂය අවසානයේ ගිණුමේ වූ මුදල් හා මුදල් හා සමාන දෑවල වටිනාකමට සමාන විය යුතු වුවත් සභාව පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම ශේෂයන් දෙක අතර රු.291,331,835 ක වෙනසක් විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි විය යුතු බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාලව ශේෂයන් හා ඒවාට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.135,371,148ක වෙනසක් විය. | එක් ගිණුම් විෂයයක් ප්‍රමාද දෝෂයකින් එසේ සටහන් කර ඇති අතර අනෙක් ගිණුම් විෂයයන් 02 ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් මස 24 දිනැති අංක 215/8 දරන ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීතිවල 7 වන වගන්තිය | 2019 දෙසැම්බර් 13 දින පැවති මහා සභා තිරණයට අනුව ජංගම දුරකථන සිම්කාඩ්පත් 60 ක් කාර්ය මණ්ඩලයේ සේවකයින් 60 ක් සඳහා ලබාගෙන 2020 දෙසැම්බර් 24 දින දක්වා වූ බිල්පත් සඳහා රු.105,393 ක මුදලක් සභා අරමුදලින් නීතියට පටහැනිව වැයකර තිබුණි. | 2019 දෙසැම්බර් 13 දින පැවති මහ සභා රැස්වීමේදි සභාපතිතුමාගේ යෝජනාවකින් සිම් කාඩ් පත් ලබා දිමට අනුමැතිය ලබාගෙන ඇති බව දන්වමි. | රීතිවලට අනුව කටයුතු කළ යුතුවේ. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු. 220,682,923 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 170,504,415 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට වරිපනම් බදු හිගය රු 35,023,471 ක් වූ අතර විගණන දිනය වූ 2021 දෙසැම්බර් 31 දිනට එම හිගයෙන් අය කර තිබූ මුදල රු.12,702,542 ක් පමණි. | හිග අය කිරීමට කටයුතු කරන බව දන්වමි. | හිග අය කිරීමට කටයුතු කළ යුතුවේ. |

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක පී/එල්/7/1/8/1/පොදු හා 2020 මාර්තු මස දින රහිත ලිපිය මඟින් පළාත් පාලන ආයතන සතු අරමුදල් මගින් නොමිලයේ භාණ්ඩ ලබාදීම කළ නොහැකි බවද දන්වා තිබියදී, ප්‍රදේශයේ ජනතාව වෙත එළවළු මලු නොමිලයේ බෙදාදීම සඳහා සභා අරමුදලින් රු.1,954,454 ක් වැයකර තිබුණි. සභාවේ සියළු සභිකයන්ගේ අදහස් යෝජනා සැලකිල්ලට ගෙන වඩාත් යෝග්‍ය ක්‍රමවේදයක් අනුගමනය කිරිමට කටයුතු කර නොකිරීම නිසා ජුනි 01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැලසුම් කමිටුවේ බහුතර සමාජිකයින්ගේ විරුද්ධත්වය ප්‍රකාශකර 2020 ජුනි 12 දිනදී සභාව විසින් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබියදි එයින් වවුචර 06 ක වටිනාකම වූ, රු.909,620 ක ගෙවීමක් සිදුකර තිබුණි. | දින රහිත ලිපිය 2020 මාර්තු 31 දිනෙන් පසුව නිකුත් කර ඇති බැවින් ඒ වන විට සභාව එළවලු බෙදා දීමේ කටයුතු අවසන් කර ඇති බව දන්වමි. | චක්‍රලේඛවලට අනුගත විය යුතු අතර ගෙවීම් සඳහා සභාවේ අනුමැතිය ලබා ගත යුතුවේ. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආඩිඅම්බලම පිහිටි වල්පොලවත්ත නැමති ඉඩමේ පොදු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත වෙන්කර දී තිබූ පර්චස් 28 ක බිම් කොටස ඔප්පුවක් මගින් පවරා ගෙන නොතිබුණි. එහි අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා විධි විධාන නොයෙදිම හේතුවෙන්, එම බිම් කොටසින් පර්චස් 2.65 ක ප්‍රමාණයක්, ඉදිකරමින් පවතින නිවසක කොටසක් හා මායිම් තාප්පයක අත්තිවාරමක් මගින් අනවසර පරිහරණයකට ලක් වී තිබුණි. 2020 ජූලි 01 දිනැති පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපියෙහි උපදෙස් ප්‍රකාරව අනවසර ඉදිකිරිම් ඉවත් කිරීමට හා ඉඩමේ සන්තකය ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. | සභාවේ වත්කම් ආරක්ෂා කිරීමට පියවර ගත යුතුවේ. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාලව සභාව විසින් ඉල්ලීම් කරන ලද මුද්දර ගාස්තු රු.68,327,779 ක් විවිධ හේතු සඳහන් කර ආපසු පැවරිය නොහැකි බවත් එම හේතු නිවැරදි කර නැවත ඉදිරිපත් කරන්නේ නම් ගෙවීම් කළ හැකි බවත් බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස් විසින් දන්වා තිබුණද අදාල නිවැරදි කිරීම් සිදු කර එම මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | එම මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සභාවට අයත් ආදායම් ගෙන්වා ගැනීමට පියවර ගත යුතුවේ. |